# සැපවත් - ප්‍රීතිමත් සමාජයක්

ශ්‍රී ලංකාවේ පවුල් සැළසුම් කටයුතු නංවා ලීමට නව රජය තීරණය කර තිබේ. පසුගියදා ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි මේ බැව් පැහැදිලි කර තිබුණි. එම ප්‍රකාශනයෙහි දක්වා ඇත්තේ මෙසේය: රජය මගින් වඩාත් පෘථුල ලෙස පවුල් සැළසුම් සේවා සළසනු ඇත. පමණට වඩා ජනගහණය ඉහළ යාම පාලනය කිරීම් වස් පවුල් සැළසුමෙහි යෙදෙන පුද්ගලයින්ට පාරිතෝෂිකයක් දීමේ ක්‍රමයක් ඇති කෙරෙන්නේය.

අද ලොව ජනගහනය වැඩිවීමේ වේගයත් ආහාර හා අනෙකුත් අවශ්‍යතාවයන් එසේ වැඩි නොවී සීමා සහිත ප්‍රමාණයකින් සැපයීමත් හේතු කොට සංවර්ධනය වූ රටවල් මෙන්ම සංවර්ධනය වන රටවල්ද ජනගහනණය වර්ධනය දෙස මහත් තැතිගැන්මකින් බලන අතර ජනගහණය පාලනය කිරීමේ ඇති අවශ්‍යතාවය වටහා ගෙන ඇත. එම නිසා එම රටවල් පවුල් සැළසුම් කටයුතු පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීමට පටන් ගෙන තිබේ.

කුඩා පවුල් ඇතිවීමට සැළැස්වීම රටක ආර්ථිකය නැංවීමේ අත්තිවාරම බවත් එසේ වූ විට ආහාර, ඇඳුම්, පැළඳුම්, නිවාස හා අනෙකුත් පහසුකම් අතින් දියුණු වීම හේතු කොට ජනතාවට උසස් ජීවන තත්ත්වයක් ලැබෙන බවත් අද පිළිගත් මතයයි. තවද සෞඛ්‍ය සම්පන්න හා ශක්ති සම්පන්න ජනතාවක් ඇතිවීමට මෙය හේතුවන බැවින් එවැනි රටක දිළිඳු කමත් ලෙඩ රෝගත් හීන වෙයි.

පසුගිය කාලයේ අපරට පවුල් සැළසුම් කටයුතු ක්‍රම ක්‍රමයෙන් දියුණු බවට පත්විය. මේ හේතු කොට වැඩි වන ජනගහණ ප්‍රශ්නයට මුහුණ දීමට හැකි තත්ත්වයක් උදා වී ඇත්තේය. මෙකී කටයුතු රජයේ දෙපාර්තමේන්තු යටතේ ඇති ව්‍යාපෘතීන් ගණනාවක් මගිනුත් ස්වේච්ඡා සංවිධාන කීපයක් මගිනුත් කරගෙන යනු ලැබීය.

1958 සිට රජය පවුල් සැළසුම් කටයුතු ක්‍රියාත්මක කරන්නට පටන්ගත් නමුත් දීප ව්‍යාප්ත පවුල් සැළසුම් වැඩ පිළිවෙල ක්‍රියාත්මක වූයේ 1966 සිටය. රටේ උපත් ප්‍රමාණය 1976 වන විට ජනගහනයෙන් 1000 කට 25 ක් වනසේ අඩු කිරීම එම වැඩ පිළිවෙලේ අරමුණ විය.

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මගින් පසුගිය අවුරුදු කීපය ඇතුළත මෙම පවුල් සැළසුම් කටයුතු සඳහා ඩොලර් 60 ලක්ෂයක මුදලක් ලබා දී ඇත්තේය. ගම්බද පොදු ජනතාව අතරට පවුල් සැළසුම් කටයුතු ගෙන යාම සඳහා මෙම ආධාරයන් උපකාරී විය.

නව රජය මෙරට පවුල් සැළසුම් කටයුතු නංවා ලීමට ගත් තීරණය දුගී බවින් හා මන්ද පෝෂණයෙන් තොර ප්‍රීතිමත්වූත්, සෞඛ්‍ය සම්පන්න වූත් සමාජයක් ගොඩනැගීම සඳහා හේතු වනු ඇත.

(1977 සැප්තැම්බර් ''සංදේශය'' ප්‍රවෘත්ති පත්‍රිකාවෙන් උපුටාගන්නා ලදී.)

★ ★ ★ ★ ★

නිරෝගී දූ දරුවන් —
රටට ආශීර්වාදයකි